මගේ අංකය:- SG/Admin/CS /8/මැතිවරණ
ආයතන අංශය
මිනින්දෝරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

20 JUL 2020

2020.07.17 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැ.සි.ආ.) / සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී, කාර්මික හා පරිපාලන නිලධාරීන්,
පරිපාලන නිලධාරී (වැ.බ.),

**i. පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන්**
**ඡන්ද විමසීමේ රාජකාරී සඳහා නිල වාහන (Assigned Vehicles) රැගෙන යාම**

**ii. පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**මැතිවරණ රාජකාරී සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම**

උක්ත කරුණු සම්බන්ධව මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 2020.07.06 දිනැති PE/2020/TR - 10 හා PE/2020/TR - 11 දරණ චක්‍රලේඛ හා බැඳේ. (අදාළ චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත).

02. ඒ අනුව එම චක්‍රලේඛයන්හි සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින අදාළ නිලධාරීන් මෙම කරුණු පිළිබඳව දැනුවත් කර ඒ අනුව කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.පී. හේරත්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් කාර්යාලය
තැ.පෙ. 506, කිරුළ පාර,
කොළඹ 05.

එච්.එම්.ටී.පී.හේරත්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426
*web : www.elections.gov.lk*
*e-mail : info@elections.gov.lk*

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)


20 JUL 2020

මගේ අංකය : **TR/PE/01/2020** | ඔබේ අංකය : | දිනය : 2020.07.06
எனது இல. | உமது இல. | திகதி

සර්වේයර් ජනරාල් කාර්යාලය
15 JUL 2020
ලැබීම් අංශය

**චක්‍රලේඛ අංක PE/2020/TR - 10**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා**
**සියළුම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත,**

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**
**<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්/ සහකාර තේරීම් භාර නිලධාරීන්</u>**
**<u>ඡන්ද විමසීමේ රාජකාරී සඳහා නිල වාහන (Assigned Vehicles )රැගෙන යාම</u>**

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී හෝ සහකාර තේරීම් භාර නිලධාරී වශයෙන් පත්වීමක් ලබා ඇති නිලධාරීන්ට තමාට හිමි නිල වාහනයක් තිබේ නම් එම නිල වාහනය තම කාර්යාලය / නිවසේ සිට තේරීම් භාර නිලධාරී කාර්යාලයට යාම සඳහා භාවිතා කිරීම අනුමත කරමි. ඒ සඳහා දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර ඒ සඳහා භාවිතා කළයුතු **V-6** ආකෘතිය මේ සමග අමුණා ඇත.

**02. වෙන්කළ වාහනයක් භාවිතා කිරීමට හිමිකම් ඇති නිලධාරියෙකුට වෙන්කර ඇති වාහනය ඔහුගේ/ ඇයගේ පෞද්ගලික වාහනය සේ සළකා කටයුතු කළ හැකිය.තම නිල වාහනය රැගෙන යන නිලධාරීන් අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී කාර්යාලයට යාමට ඇති දුර ප්‍රමාණයට <u>අවශ්‍ය ඉන්ධන තම පෞද්ගලික මුදලින් ලබාගෙන අදාළ බිල්පත් මැතිවරණ මහලේකම් කාර්යාලයට ඉදිරිපත් කල පසු එම මුදල ප්‍රතිපූර්ණය කරනු ඇත. මෙම නිලධාරීන් තම කාර්යාලයෙන් හෝ තේරීම් භාර නිලධාරීන්ගෙන් ඉන්ධන ලබා ගැනීම සිදු නොකළ යුතුය.</u> නමුත් නිල වාහන රැගෙන එන නිලධාරියෙකු ඡන්ද විමසීමේ කටයුතු නිම කිරීමෙන් පසු ආපසු සිය නිවෙස බලා යාමට තේරීම් භාර නිලධාරීන්ගෙන් ඉන්ධන ඉල්ලා සිටියහොත් ඔහුට ආපසු යාම සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ගණනය කර එම ඉන්ධන ප්‍රමාණය ලබාදීම අනුමත කරමි. තවද එසේ ලබාදුන් ඉන්ධන ප්‍රමාණය ඉන්ධන ප්‍රතිපූර්ණ ආකෘතියේ (AV-01) සටහන් කළ යුතුය. (AV-01) ආකෘතියේ පිටපතක් මේ සමග අමුණා ඇත. එසේ ඉන්ධන ඉල්ලුම් කළ නිලධාරීන් පිළිබඳව වාර්තාවක් ඒ ඒ දිස්ත්‍රික්කවල තේරීම් භාර නිලධාරී නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් විසින් මේ සමඟ යා කර ඇති ආකෘති පත්‍රය මගින් මා වෙත එවීමට කටයුතු කළ යුතුය. <u>තවද සමහර නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා අදාළ තේරීම්භාර නිලධාරි කාර්යාලයට යාමට හා ඒමට අසාමාන්‍ය දුර ප්‍රමාණයන් සඳහන් කර එම කාර්යාලයට යාමට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් වැඩි ඉන්ධන ප්‍රමාණයක් තම පෞද්ගලික මුදලින් ලබාගෙන එම ඉන්ධන බිල්පත් ප්‍රතිපූර්ණයට ඉදිරිපත් කරන බව පසුගිය ඡන්ද විමසීමේදී දක්නට ලැබුණි. එබැවින් එවැනි අසාමාන්‍ය දුර ප්‍රමාණයන් සඳහන් ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට කටයුතු කල යුතුය.</u>**

03. මැතිවරණ රාජකාරිය සඳහා නියමිත දිස්ත්‍රික්කයට යාමට අවශ්‍ය ඉන්ධන සඳහා ඔබට වැය වූ මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා මේ සමග අමුණා ඇති **AV-01** ආකෘතිය සම්පූර්ණ කර අදාළ බිල්පත් සමඟ සම්පූර්ණ කරන ලද පොදු 35 වවුචරයක් ඡන්ද විමසීම අවසන් වීමෙන් පසුව මැතිවරණ මහලේකම් කාර්යාලයට එවීමට කටයුතු කරන්න. ***ඡන්ද විමසීමේ රාජකාරීන්හි නිරත වූ නිලධාරීන්ට කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමට ඉදිරිපත් කරන ආකෘති වල ඉන්ධන ලබා ගැනීමට වැය වූ මුදල ප්‍රතිපූර්ණ කරගැනීමේ ඉල්ලීම ඇතුලත් නොකළ යුතුය.*** නිල වාහනය රැගෙන යාමේදී රජයේ රියදුරෙකු යොදවා ගත යුතු අතර ඒ සඳහා වූ ගෙවීම් උපදෙස් ඉදිරියේදී මවිසින් නිකුත් කරනු ලබන ගෙවීම් චක්‍රලේඛය මගින් ලබා දෙනු ඇත. මෙම රියදුරන්ගේ පැමිණීමේ සහතිකය ලෙස CE 51 පත්‍රිකාව ලබා ගත යුතුය.

04. උපදෙස් පන්ති වලට සහභාගිවීම පිණිස තම පෞද්ගලික වාහනය යොදා ගන්නා නිලධාරීන් එසේ පෞද්ගලික වාහනයකින් පැමිණි බවට පැමිණීමේ සහතිකයක් ඉදිරිපත් කරන්නේ නම් ගමන් කල දුර ප්‍රමාණය වෙනුවෙන් ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ නියමයන්ට අනුව සැතපුම් කුලිය ලබාගත හැකිය. තවද පෞද්ගලික පාවිච්චිය සඳහා ද වෙන්කල නිල වාහන භාවිතා කරන නිලධාරීන්ට ඉන්ධන අවශ්‍ය වේ නම් ඒ සම්බන්ධයෙන් උපදෙස් පන්ති කැඳවීම් සිදුකළ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් හරහා ලිඛිතව මැතිවරණ කොමසාරිස් ජනරාල් විමසීම යෙහෙකි.

05. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ අමාත්‍යාංශය යටතේ ඇති සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත යැවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කොට සළකමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

**පිටපත්:**

1. විගණකාධිපති
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) - දැනගැනීම සඳහා
3. සියළුම තේරීම් භාර නිලධාරීන්/ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - අවශ්‍ය අනුමැතිය ලබා දීමට හා දැනුවත් කිරීම සඳහා
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී - අවශ්‍ය කටයුතු සඳහා
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැනගැනීමසඳහා
6. ගණකාධිකාරී (ප්‍රසම්පාදන) - සෑම දිස්ත්‍රික්කයටම අවශ්‍ය තරම් CE 51 පත්‍රිකා ලබා දීමට
7. ගණකාධිකාරී (ගෙවීම්) - දැනගැනීම සඳහා

**අනුමැතිය සඳහා පිටපත් 02 ක් සම්පූර්ණ කර අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී / නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත යවන්න.**

## <u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>

## <u>නිල වාහන හිමි නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා තම නිල වාහන රැගෙන යාමට අනුමැතිය ඉල්ලීම</u>

1. නිලධාරියාගේ නම : ..................................................
2. තනතුර : ..................................................
3. කාර්යාලයීය ලිපිනය : ..................................................
4. වාහන අංකය : .............................. වාහන වර්ගය : කාර් /කැබ් / ජීප්
5. වාහනය පෙට්‍රල් ද ඩීසල් ද යන වග : පෙට්‍රල් ☐ ඩීසල් ☐

   (අදාල කොටුව තුළ √ ලකුණ යොදන්න )

6. ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කය : ..................................................
7. ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පත්කර ඇති තනතුර : ..................................................
8. කාර්යාලයීය දුරකථන අංකය: ..................................................
9. ෆැක්ස් අංකය : ..................................................

ඉහත අංක දරණ මාගේ නිල වාහනය .................................................................. දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පැමිණීම පිණිස යොදා ගැනීමට අනුමැතිය පතමි.

දිනය : ....................................

............................................................
ඉල්ලුම් කරන නිලධාරියාගේ අත්සන

ඉහත නම් සඳහන් නිලධාරියාගේ අංක .................................................. දරණ නිල වාහනය මෙම දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පැමිණීමට යොදා ගැනීම අනුමත කරමි.

දිනය : ....................................

............................................................
දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී /නියෝජ්‍ය / සහකාර
මැතිවරණ කොමසාරිස්
.......................................... දිස්ත්‍රික්කය.

***සහකාර තේරීම්භාර නිලධාරී (ප්‍රවාහන)**

අනුමත කිරීමෙන් අනතුරුව මෙහි එක් පිටපතක් ගොනුකර තබාගත යුතු අතර, අනෙක් පිටපත නිලධාරියා වෙත යැවීමට කටයුතු කරන්න. (ෆැක්ස් කිරීම වඩාත් යෝග්‍ය වේ.)

**සැ.යු.** නිලධාරියා තම පෞද්ගලික මුදලින් ඉන්ධන ලබාගත යුතු අතර එය මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රතිපූර්ණය කරනු ඇත.

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

### ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී/ සහකාර භෞර්භාර නිලධාරී විසින් රැගෙන යන ලද (නිල වාහන) (Assigned Vehicles) වලට ලබාගත් ඉන්ධන සඳහා වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම.

අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ නම : ෆැක්ස් අංකය:

ලිපිනය : දුරකථන අංකය :

| 01 | 02 | 03 | 04 | 05 | 06 | 07 | 08 | 09 | 10 | 11 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිලධාරියාගේ නම | තනතුර | වාහන අංකය | ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාර්තා කළ දිස්ත්‍රික්කය | ඡන්ද විමසීමේ රාජකාරී සඳහා වාර්තා කළ දිනය | එම දිස්ත්‍රික්කයට යාමට හා ආපසු පැමිණීමට ධාවනය කළ කි.මී. ගණන | ඔබ විසින් මුදල් ගෙවා ලබාගත් ඉන්ධන ප්‍රමාණය ලීටර් | භාරකාර නිලධාරී ලබාදුන් ඉන්ධනප්‍රමාණය ලීටර් | ඉන්ධන වර්ගය (ඩීසල් /පෙට්‍රල්) | ඉන්ධන දැවීම (ලීටරයට කි.මී.) | ප්‍රතිපූරණය සඳහා ඉල්ලා සිටින මුදල රු. | ශත. |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේදී ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරී/ සහකාර භෞර්භාර නිලධාරී වශයෙන් සේවය කිරීම සඳහා මගේ නිල වාහනය ................................ දිස්ත්‍රික්කයේ රාජකාරි සඳහා යාමට යොදාගත් බව සහතික කරමි. එම ගමන සඳහා ධාවනය වූ කි.මී ගණන ................ කි. ඒ සඳහා වැයවූ පෙට්‍රල් / ඩීසල් ලීටර්........................ක් වෙනුවෙන් රු. ......................... මගේ පෞද්ගලික මුදලින් වැය කළ බව සහතික කරමි. එම මුදල ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාළ බිල්පත් සමඟ සම්පූර්ණ කරන ලද පොදු 35 ගෙවීම් වවුචරයක් මේ සමඟ එවා ඇත.

............................................

නිලධරයාගේ අත්සන

නම සහිත නිල මුද්‍රාව තබන්න.

දිනය : 2020.

මගේ අංකය:- SG/Admin/CS /8/මැතිවරණ
ආයතන අංශය
මිනින්දෝරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

2020.07.17 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැ.සි.ආ.) / සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් / මිනින්දෝරු අධිකාරිවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි, කාර්මික හා පරිපාලන නිලධාරින්,
පරිපාලන නිලධාරි (වැ.බ.),

i. <u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>
<u>ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් / සහකාර තේරීම් භාර නිලධාරීන්</u>
<u>ඡන්ද විමසීමේ රාජකාරී සඳහා නිල වාහන (Assigned Vehicles) රැගෙන යාම</u>

ii. <u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>
<u>මැතිවරණ රාජකාරී සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම</u>

උක්ත කරුණු සම්බන්ධව මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 2020.07.06 දිනැති PE/2020/TR - 10 හා PE/2020/TR - 11 දරණ චක්‍රලේඛ හා බැඳේ. (අදාළ චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත)

02. ඒ අනුව එම චක්‍රලේඛයන්හි සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින අදාළ නිලධාරීන් මෙම කරුණු පිළිබඳව දැනුවත් කර ඒ අනුව කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.පී. හේරත්

එච්.එම්.ටී.පී.හේරත්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය: 011-2868441, 2858442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம
சரண மாவத்தை, இராஜகிரிய(10107)

web : www.elections.gov.lk e-mail : info@elections.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය : TR/PE/01/2020<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2020.07.06<br>திகதி |

සර්වේයර් ජනරාල් කාර්යාලය
15 JUL 2020
ප්‍රගති අංශය

චක්‍රලේඛ අංක PE/2020/TR - 11

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
සියළුම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත,

<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>
<u>මැතිවරණ රාජකාරි සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරි දුම්රිය බලපත් නිකුත් කිරීම.</u>

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ රාජකාරි සඳහා තෝරා ගෙන ඇති ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරි සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කයට යාමට රාජකාරී දුම්රිය බලපත් ඉල්ලා සිටින්නේ නම් එම ඉල්ලීම පරිදි ඔවුනට රාජකාරි දුම්රිය බලපත් නිකුත් කිරීමට කරුණාකර පියවර ගන්න. එම බලපත් නිකුත් කිරීම, ආයතන සංග්‍රහයේ සඳහන් දුම්රිය බලපත් නිකුත් කිරීම හා සම්බන්ධ විධිවිධාන පරිදි සිදුකළ යුතුවේ.

02. බලපත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02.1 දෙපාර්තමේන්තු සංකේත අංකය ලෙස 5422/1 රබර් මුද්‍රාවකින් සටහන් කිරීම වෙනුවට පැහැදිලි ලෙස අතින් ලියන්න.

02.2 රාජකාරියේ ස්වභාවය "2020.08.05 දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරි" යනුවෙන් ද සටහන් කරන්න.

02.3 වැය ශීර්ෂය :20-1-1-1409 (2)

03. බලපත් නිකුත් කරන ලද නිලධාරියාගේ තනතුර සටහන් කිරීමට ඇති ස්ථානයේ බලපත්‍රය අත්සන් කරන ලද නිලධාරියාගේ නිල මුද්‍රාව තබා ඊට යටින් "මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට" යනුවෙන් අකුරින් ලියන්න.

04. මේ යටතේ නිකුත් කරන සියළුම බලපත්‍ර නිරවුල් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරනු ඇත. එහෙයින් මැතිවරණ රාජකාරි සඳහා නිකුත් කරනු ලබන දුම්රිය බලපත් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන විසින් මුදල් ගෙවීමක් සිදු කළයුතු නොවේ.

02 පිටුවට.

05. මැතිවරණ රාජකාරි සඳහා නිකුත් කරනු ලබන සියළුම දුම්රිය බලපත් පිළිබඳ විස්තරයක් ඉහත සමග අමුණා ඇති ආදර්ශ ලිපිය පරිදි සකස් කර ඡන්ද විමසීම නිමවී සති දෙකක් තුළදී මා වෙත ලැබෙන සේ එවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වෙත යැවීමට ද කරුණාකර කටයුතු කරන්න.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත්:

1. විගණකාධිපති.
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
3. ප්‍රධාන මූල්‍ය නිලධාරි - ශ්‍රී ලංකා දුම්රිය සේවය.
4. ප්‍රධාන මූල්‍ය නිලධාරි - මැ.කො.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි - මැ.කො.ස.
6. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) - දැනගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා
7. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
9. ගණකාධිකාරි (ගෙවීම්) - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல்: 011-2868445
*e-mail :chairman@elections.gov.lk*

සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
உதவித் தேர்தல்கள் ஆணையாளர் (நிருவாகம்)
දුරකථන/தொலைபேசி:011-2868450
ෆැක්ස්/தொலைநகல் : 011-2868450
*e-mail : admin@elections.gov.lk*

පරිපාලන නිලධාරි
நிருவாகஅலுவலர்
දුරකථන/தொலைபேசி: 011-3083371
ෆැක්ස්/தொலைநகல் :011-3083371
*e-mail : info@elections.gov.lk*

E:\2020 Election\circulars\PE-2020-TR-11.docx

මගේ අංකය :
දිනය :

**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

**<u>පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05</u>**

**<u>මැතිවරණ රාජකාරි සඳහා සහභාගි වූ කාර්ය මණ්ඩලයට නිකුත් කළ රාජකාරි දුම්රිය බලපත්</u>**

2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරි සඳහා පත්කරනු ලැබූ නිලධාරීන්ට මෙම අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරි දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

02. මෙම බලපත්‍ර සඳහා අදාළ බිල්පත ඔබගේ වැය ශීර්ෂයන්ගෙන් නිරවුල් කිරීම සඳහා පහත විස්තර ඔබ වෙත ඉදිරිපත් කරමි.

..............................................................
ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා

..............................................................අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව

| (1) බලපත්‍රය නිකුත් කළ දිනය | (2) නිලධාරියාගේ නම | (3) බලපත්‍ර අංකය | (4) දුම්රිය ස්ථාන | |
|---|---|---|---|---|
| | | | ගමන ආරම්භ කළ දුම්රිය ස්ථානය | ගමන අවසන් කළ දුම්රිය ස්ථානය |
| | | | | |